# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 83 — 1973 ඔක්තෝබර් 26 වැනි සිකුරාදා — 1973.10.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙනවෙනම් පිටු අංක යොදා ඇත)

| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම් ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... | 189 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන .. | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා රට පහල උසාවිවල දැන්වීම් ... | 189 | නොතාරිස් ලැයිස්තුව ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... | 191 |

සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් ද පළවේ.

## දිස්ත්‍රික් උසාවිවල හා රට පහල උසාවිවල දැන්වීම්

මාතර දිස්ත්‍රික් උසාවියේ පැරණි නඩු වාර්තා

වර්තාකමින් තොර ලිපි ලේඛන විනාශ කිරීමේ නීතිගත ආඥා පනතේ 479 පරිච්ඡේදයේ 5 වැනි වගන්තිය යටතේ මේ දැන්වීමේ දින සිට තුන් මසක් ඉකුත් වීමෙන් පසු මාතර දිස්ත්‍රික් උසාවියේ 1928 අංක 7004 සිට 1950 අංක 23140 දක්වා පවරා ඇති සියළුම මුදල් (money) නඩු වාර්තා විනාශ කරන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

ඉහත කී නඩුවලින් යම් නඩු වාර්තාවක් විනාශ නොකර තැබීමට කරුණක් ඇත් නම් ඒ කාරණ මේ තුන්මස තුළ මට දැනුම් දිය යුතුය.

ඇන්ටන් සෝසා,
මාතර දිසා විනිසුරු.

1973 ඔක්තෝබර් මස 13 වෙනි දින,
මාතර දිස්ත්‍රික් උසාවියේ දී ය.

10–1015—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## මුදල් නඩු පිළිබඳ දැන්වීම්

නඩිසයි අඥව

කොළඹ දිසා අධිකරණයේ දීය

මාවතගම, යටිවිල්ලේ සිට නැසීගිය හොරතලයේ ආරියවංශ පියදාස ගේ මුදලය සම්බන්ධවයි.

කහපත්වල අත්තිකඩේ පදිංචි රූපස් සර්ගේ සිරිසේන
...................................................... පෙත් සම්කරු.

මුදල් නඩු අංක 26,680/ට උදිරිව

(1) මාවතගම, වැලිගෙපොළ, නන් දන වතුයායේ පදිංචි හොරතල්ගේ ආරියවංශ ඥානවති රූපරත්න, (2) කහපත්වල අත්තිකඩේ පදිංචි හොරතල්ගේ ආරියවංශ චිත්‍ර සිරිසේන
...................................................... වගඋත්තරකරුවෝ.

මෙම කාරණය වර්ෂ 1973ක් වූ මාර්තු මස 1 වෙනි දින කොළඹ අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර අයි. ජී. ඇස්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා තීරණයකට පැමිණ ඉහත කී පෙත්සම්කරු වෙනුවෙන් කේ. අයි. ජී. ඇල්. ඩබ්ලිව්. පෙරේරා පෙරකදෝරුතුමා පෙනී සිටියදී,

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

189—B 71064 — 5,732 (73/10)

සෝමාගම යුද්ධ හමුදා නිවාසයන්හි පදිංචිව සිට නැසීගිය අබේසිංහ හෙට්ටිගේ උපාලි නොයෙල් වීරකෝන්ගේ බූදලය නැසීගිය අය.

පෙත්සම්කාරිය වෙනුවෙන් එස්. රාමචන්ද්‍රන් පෙරකදෝරු මහතා පෙනී සිටියදී වර්ෂ 1972 ක්වූ ඔක්තෝබර් මස 27 වෙනි දින කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන්පත් එම්. එම්. අබ්දුල් කාදර් මහතා ඉදිරිපිටදී මෙම කාරණය විභාග කිරීම පිණිස ගෙන පෙත්සම් කාරියගේ වර්ෂ 1972 ක්වූ අප්‍රේල් මස 8 වෙනි දින දරණ දිවුරුම් පෙත්සම කියවා බලන ලදුව,

ඉහත කී වගඋත්තරකාරයින් හෝ මේ ගැන සැලකිල්ලක් දක්වන වෙනත් අයෙක් හෝ අයවලුන් විසින් වර්ෂ 1973 ක්වූ පෙබරවාරි මස 6 වෙනි දින හෝ එදිනට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සෑහෙන විරුද්ධවාදිකම් ඉදිරිපත් නොකළහොත්,

මෙහි 1 වෙනි 2 වෙනි වගඋත්තරකාරයෝ බාලවයස්කාරයින් බැවින් මෙහි 3 වෙනි වගඋත්තරකාරයා ඔවුන්ගේ භාරකාරයා වශයෙන් පත් කිරීමටද,

ඉහතකී පෙත්සම්කාරිය වන සාන්ති රම්‍යා මානෙල් වීරකෝන්ට ඉහතකී බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලකඩදාසි පවරා දීමටද නියෝග කරනු ලැබේ.

එම්. එම්. අබ්දුල් කාදර්,
කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1972ක්වූ ඔක්තෝබර් මස 27 වෙනි දින දී ය.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දිනය වර්ෂ 1793ක්වූ මැයි මස 29 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

එම්. එම්. අබ්දුල් කාදර්,
කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1973ක්වූ පෙබරවාරි මස 6 වෙනි දින දීය.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දිනය වර්ෂ 1973ක්වූ සැප්තැම්බර් මස 4 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

එම්. එම්. අබ්දුල් කාදර්,
කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1973ක්වූ මැයි මස 29 වෙනි දින දීය.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දිනය වර්ෂ 1973ක්වූ නොවැම්බර් මස 13 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

එම්. එම්. අබ්දුල් කාදර්,
කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන.

වර්ෂ 1973ක්වූ සැප්තැම්බර් මස 4 වෙනි දින දීය.

10–857—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

**සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

ඊ. එල්. සේනානායක වන මම, ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍ය සභාවේ 52 වන ස්ථාවර නියෝග යටතේ, "සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් ජාතික රාජ්‍ය සභාවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ, පහත සඳහන් පරමාර්ථ ඇති සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය නීතිගත කිරීමය.

(අ) සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලාව පිහිටුවනු ලැබුවේ යම් අරමුණු හා පරමාර්ථ සඳහා ද ඒ අරමුණු හා පරමාර්ථ අනුව සහ වර්ෂ පනහක කාලය තුළ එකී විශ්‍රාම ශාලාව පවත්වා ගෙන එනු ලැබූ පදනම වූ බෞද්ධ මූල ධර්ම ප්‍රායෝගික වශයෙන් පිළිපැදීම සුරක්ෂිත කිරීම පිණිස එකී විශ්‍රාම ශාලාව බෞද්ධ මහාජනයාගේ ආධාර ඇතිව කාර්යක්ෂමව නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීම;

(ආ) සංස්ථාවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කමිටුව සතු කිරීම යනාදිය වේ.

ඊ. එල්. සේනානායක,
මහනුවර මහජන මන්ත්‍රී.

10–1012—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. **සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ඔක්තෝබර් ... | 73.10.05 සිකුරාද ... | 73.09.28 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.12 සිකුරාද ... | 73.10.05 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.19 සිකුරාද ... | 73.10.12 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.26 සිකුරාද ... | 73.10.19 සිකුරාද | දහවල් 12.00 |
| නොවැම්බර් ... | 73.11.02 සිකුරාද ... | 73.10.26 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.09 සිකුරාද ... | 73.11.02 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.16 සිකුරාද ... | 73.11.09 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.23 සිකුරාද ... | 73.11.16 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.30 සිකුරාද ... | 73.11.23 සිකුරාද | දහවල් 12.00 |
| දෙසැම්බර් ... | 73.12.07 සිකුරාද ... | 73.11.30 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.14 සිකුරාද ... | 73.12.07 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.21 සිකුරාද ... | 73.12.14 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.28 සිකුරාද ... | 73.12.21 සිකුරාද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.